හොඳ සිංහල

වි ක ධර්මබන්ධු

අද අපි පලමුවෙන්ම හංස සංදේසයේ ඇති මේ කවි දෙක කියවා තේරුම් ගෙන අපේ පාඩම පටං ගනිමු.

*මිනිසෙක් දිය පීනා යෙය් එතරට
අඟනක් දිය පීනා එය් මෙතරට
පහරක් දුන් සරනින් ඔහු සිරසට
අනෙකක් හැඬුවා එසඳෙහි දුරසිට

1. මිනිසෙක් දිය පීනා (ගෙන) එතරට යෙය්
2. අඟනක් දිය පීනා (ගෙන) මෙතරට එය්
3. (ඇය) ඔහු සිරසට (තම) සරනින් පහරක් (දුන්හ) දුන.
4. එ සඳ අනෙකක් (අන් අඟනක්) දුර සිට හැඬුවා (ය).

මෙතර සිට එතරට පිහිනා ගෙන ගිය මිනිසාගේ (අනියම්) මිතුරු ගැහැනියක් ඔහු හරස් කර පිහිනමින් ඔහුගේ හිසට පය්න් ගැසුවා විය යුතුය. ඒ ඇඟෑලුම් කමට ය. ඈ ඔහුගේ ප්‍රතිචාරය බලාපොරොත්තු වන්නටද ඇත. මේ සිද්දිය දුටු ඔහුගේ (නියම්) මිතුරු ගැහැනිය නොහොත් බිරිය දුර දිට හැඬුවා විය යුතුය. තම සැමියා සමග අන් ගැහැනියක කොමල කරනු දකින්නට බිරියෝ කැමති නො වෙති.

මේ කවියේ හතර වන අකුරට 'ක්' එලි වැට තැබීමට යෑම නිසා සුලු අවිලක් ඇති වී තිබේ. විරිතත් එලිවැටත් රැකීම සඳහා 'අනෙකක්' යොදා ඇති මුත් සාමාන්‍ය වියහාරයේ ඒ වෙනුවට බාවිතා වන්නේ 'අන් අඟනක් - වෙනත් ගැහැනියක්' වැනි පදයකි. මේ කවිය 'නිසඳැස් පජ්ජකින්' ලියුවා නම්,

"මිනිසෙක් එතරට
පීනා යෙය්
අඟනක් දිය පීනා
මෙතරට එය්
අතර මග දී
ඇය
ඔහුගේ සිරසට
පා පහරක් දුන
එ විට
දුරින් සිටි
වෙනත් අඟනක්
හැඬුවාය" වැනි කියමනක් ලියවෙන්නට ඉඩ තිබිනි. එවිට 'අනෙකක්' යන පදය උවමනා නැත.

*අඟනක් පය ගෑ ලතු සිරසෙහි වැකි මිනිසෙක ගඟ දිය කෙලියෙන් නො වැලකි
අනෙකක ඇස රතු විය ලතු නොම වැකි
ඇයසක එතෙරට වෙන දිය කරනෙකි

1. අඟනක (ගේ) පය ගෑ ලතු (තම) සිරසෙහි වැකි (මුත්) ගඟ දිය කෙලියෙන් නොවැලකි මිනිසෙක.
2. (ඒ සිද්දිය දුටු) අන් එකක (අනෙකක) ගේ ලතු නොම වැකි ඇස රතු විය.
3. ඇය (ගේ) සක එතෙරට (හේතු වූයේ) වෙන දිය කරනෙකි.

දිය කෙලින කෙනකුගේ පයේ ගෑ ලතු අනෙකකු ගේ හිසේ වැකීම සැබෑ සිද්දියක් සේ සැලකිය හැකි නො වේ. එය සෝබන කියමනකි. එහෙත් කාමිනින් අවනත කර ගෙන තම සිතැඟි ඉටු කර ගැනීම සඳහා ඔවින්ගේ <u>පා අඟ</u> හිස උලමින් වැඳ වැටෙන පිරිමින්ගේ හිසේ නම් ලතු තැවරෙන බව "සියබස් ලකරේ" සඳහන් වේ. පා මුලත් පා අගත් පයේ දෙකෙලවරයේ. මේ කියන්නෙ ඇඟිලි සහිත පා අග ගැනයි. පා මුල ලෙස සැලකීමට සිදු වන්නේ ඉකිලි පෙදෙසයි. එතනත් ලතු ගා ගන්නා අය ඇද්දැයි නොදනිමි. බුදුන්ගේ පා මුල වැඳ වැටෙන උවසුවන් සහ උවැසියන් ගැන පොතේ පතේ සඳහන් වන්නේ වැරදීමකින් විය යුතු යයි සිතමි.

මේ කවියේත් හතර වන අකුරට 'ක' එලිවැට තැබීමට යෑම නිසා 'මිනිසෙක - අනෙකක' යන පද තෝරා ගෙන ඇත. මෙය ද 'නිසඳැස් පජ්ජකින්' ලියුවානම්,

"තමන්ගේ හිසේ
අඟනකගේ
පය ගාන ලද ලතු
තැවරී ඇතත්
දිය කෙලියෙන් නොවැලකි
මිනිසෙක් විය
එය දුටු
වෙනත් අඟනකගේ
ඇස රතු විය
ඇගේ ඇස ඒ
රතු වීමට හේතු වූයේ
කඳලු ය.

වැනි කියමනක් ලියවෙන්නට ඉඩ තිබිනි. (සකු, මධ්‍ය - විද්‍යා - පාලි මජ්ජ - විජ්ජා ඒ අනුව පද්‍ය = පජ්ජ)

ලද යම් කෙනෙක් සරසවි බැලුමසක් නිසි
කොතරම් උවත් මුලු ලොව කෙරෙති අතවැසි
එතරම් පසිඳු සරසවි දෙවිය අතවැසි
මතරම් කෙනෙක් තෙපි මය පිරිසිඳු සුබැසි

1. සරසවි නිසි බැලුම් අසක් යම් කෙනෙක් ලද (හොත්) කොතරම් උවත් ඔහු මුලු ලොව අතවැසි කෙරෙති.
2. එතරම් පසිඳු සරසවි දෙවිය අත වැසි මනරම් කෙනෙක් (නම්) පිරිසිඳු සැබැසි තෙවි ම යි

ගිරා සංදේසයේ ඇති මේ කවියේ තුන් වන පදයේ ඇති '(සරසවි) දෙවිය' ද සාමාන්‍ය වියහාරයේ නැති වචනයකි. (සරසවි - සරස්වතී) දෙවඟන දෙව්ලිය, දේවිය යනුවෙනි එය වහරෙහි පවතින්නේ. 'දේවී' යන්න 'දේව - දේවී' වී දැයි නොදනිමි. මෙතනද 'දෙවිය' යොදා ඇත්තේ 'විරිත' රැකීම සඳහා ය. වියරන නියරට අනුව මේ යෙදුම නිවරද ය. එහෙත් එය ගුරු කොට ගැනීමත් අනුයෑමත් අනතුරුදායකය. 'දෙවී' ශබ්දය - දෙවියා, දෙවියෙක්, දෙවියෙකු, දෙවියන් යනුවෙන් ඉතිරි ලියනයේ ද වරනැඟේ. දිව්‍ය (පාලි - දිබ්බ) ශබ්දය සිංහලට බිඳෙන්නේ 'දිව' කියාය. එහෙත් එය, දිවියා දිවයෙක්, දිවයකු, දිවයෝ, දිවයන් යනුවෙන් වර නැඟෙන්නේ නැත. (දේව) දෙව් ශබ්දයද දෙව්වා, දෙව්වෙක්, දෙව්වකු, දෙව්වෝ, දෙව්වන් යනුවෙන් වරනැඟෙන බවක් නො පෙනේ. දෙව්/දිව වෙනුවට 'දෙවි' ශබ්දයක් නිපදවා ගෙන අපි 'දෙවි පිහිට' ලබමු. 'ගොවි' ශබ්දය 'ගෙවි' වෙතත් එය ගෙවිය, ගෙවියෝ යනුවෙන් වියහර නො වේ. 'ලිය' ද එයට අඳා ගෙන 'ගෙවිලිය' අපි බාවිතා කරමු. කොටි සහ එලු යන ශබ්ද කෙටි , එලි නොවී කොටි දෙන, එලු දෙන යනුවෙන් වියහාරයට පැමිණ ඇත්තේ 'බලු' බැලි - බැල්ල නිවැරදි උවත් 'බැලි = බැ+ල්+ලි' වී ඇත. 'වස' වැසි - වැස්ස නිවැරදි උවත් 'වැසී = වැ+ස්+සි' වී ඇත.

සමහර ආදුනික ලේකකයන්ගේ ලිපිවල දක්නට ලැබෙන විදියේ වැකි කිහිපයක් මේ.

1.කොල්ලෙක් බල්ලෙක් නෑව්වේය(නෑවීය) නාවයි
2. ,, බල්ලන් නෑව්වෝ ය (නෑවූහ) නාවත්
3. කොල්ලන් බල්ලන් ,, (නෑවූහ) ,,
4. ,, බල්ලෙක් ,, (නෑවූහ) ,,
5. කෙල්ලක් ,, නෑව්වා ය (නෑවූහ) නාවයි
6. ,, බල්ලන් නෑව්වෝය (නෑවූහ) නාවත්
7. කෙල්ලෙක් ,, නෑව්වා ය (නෑවූහ) නාවයි
8. ,, බල්ලෙක් ,, (නෑවූහ) නාවත්
9.කෙල්ලන් බල්ලෙක් නෑව්වෝය (නෑවූහ) නාවත්
10. ,, බල්ලන් ,, (නෑවූහ) නාවත්

මේ හැම වැකියකම අදහස අපට තේරුම් ගත හැකිය. ඉතිරි ලියන පුරුස ලිංග වෙනස රැකී ඇත. ඒක වචන බහුවචන වෙනස රැකී ඇත. අතීත කාල අනතීත කාල වෙනස රැකී ඇත.රැකී නැත්තේ නාම පදවල උක්ත - අනුක්ත රූපයත්, ක්‍රියා පදවල ඒක - බහු වචන වෙනසත් ය.

මීලඟ ලිපිය තේරුම් ගැනීම සඳහා පහත සඳහන් වැකි 744 ගලපා ඉගෙන ගන්න.

මම/මං/අපි/අප
තෝ/තොපි/තෙපි/උඹ/බොලා
ඌ/ඔහු/උං/ඔව්ං
මූ/මොහු/මුං/මොව්ං
ඇය/ඈ/මැය/ම/
කොල්ලෙක්/කොල්ලකු
කොල්ලෝ/කොල්ලං
කෙල්ලක්/කෙල්ලෙක්
කෙල්ලෙකු/කෙල්ලෝ
කෙල්ලන් (31)

බල්ලෙක්/බල්ලකු
බල්ලන්/බල්ලෝ
(4)

නාවනවා
නෑව්වා
නාවලා ඉන්නවා
නාවලා හිටියා
නාවමින් ඉන්නවා
නාවමින් හිටියා
(6)

සුභාෂිතයෙන්....

සම වත වැසි සුළඟ කෙත් වත් වැඩෙන මෙන
ලොව සත රැකෙති නිසි රජ නැනැති මැතිගෙන
එ මහ තනල නලින් වන දහන වන මෙන
දුසිරිත රජ - කුමැතිගෙන් නැසෙන හැම තැන

පදාවලිය
වැසි සුළඟ සම වත
කෙත් වත් වැඩෙන මෙන
නිසි රජ
නැනැති මැතිගෙන
ලොව සත රැකෙති
එ මහත අතල නලින්
වන දහන වන මෙන
දුසිරිත රජ
කු මැතිගෙන
හැම තැන නැසෙය

තේරුම

වැස්සත් සුලඟත් සමසමව ඇති විට කෙත්වතු සරුවට වැඩෙන්නාක් මෙන් යහපත් (සුදුසු) රජෙකුත් නුවනැති ඇමතියකුත් නිසා, (ලෝ සත්තු) රටවැසියෝ ආරක්ෂා වෙති. (ඒ) මහත් වූ ගින්නකින් හා සුලඟකින් වනයක් දැවී යන්නාක් මෙන් දුසිරිතේ ගැලුනු (අයහපත්) රජකුත් දුස්ට ඇමතියකුත් නිසා හැම තැනක්ම හැම දෙයක් ම වැනසේ.

කෙත් වතු සරුවට වැඩෙන්නට වැස්සත් සුලඟත් සම සමව ලැබිය යුතු නැත. වැස්සත් (ජලයත්) හිරු එලියත් (අව්වත්) යන දෙක ය ඒ සඳහා අවශ්‍ය වන්නේ. මෙහි 'සුලඟ' යන්නෙන් 'වාතය' අදහස් කලා දැයි නොදනිමි. වාතය නැති තැනක් නැති නිසා ඒ කියමනේ තේරුමක් නැත. සුලඟ නිසා කෙත් වතු විනාශ වන සැටි නිතර අසන්නට ලැබේ.

යහපත් රජකුත් නැනවත් ඇමතියකුත් සිටින රටක් සුරක්ෂිත වීම, රටට කිරි පැනි ඉතිරිම අරුමයක් නොවේ. එසේම දුසිරිතෙහි ගැලුනු (මුසල) රජකුත් දුස්ට (පාහර) ඇමතියකුත් සිටින රටක් හිඟමනට වැටීමත් රටේ සියලු සම්පත් වැනසී යෑමත් නොවැලැක්විය හැකිය. එය හරියට ගින්නත් සුලඟත් නිසා වනයක් ගිනි ගන්නා වැනිය.

'කු' එකතු වී හැදෙන කුපුරිස්, කුකවි කුදිටු, කුමන්ත්‍රන යන පදවල ඇත්තේ 'දුස්ට' යන තේරුමයි.

මේ කවියේ 'කුමැති' යන්න 'දුස්ට ඇමති' යන තේරුම දීමට හදා ගත් පදයකි. ඔබටද එය ගුරු කමට ගත හැකිය.

කුරපුන්, කුපියන්, කුමච්න්, කුගුරන්, කුමිතුරන්, කුසැමියන්, කුබිරියන් වැනි පද ඔබට ද හදා ගත හැකිය.

'ච මහත්' යන තැන 'ච' යන්න 'සක්' (සක්ක) පදයකි. මහත් +අනල සන්ඳි වී 'මහතනල්' හැදී ඇත.

වි. ක. ධර්මබන්දු

Jayapathi Associates
LAWYERS & MIGRATION AGENTS
For all legal and migration matters

Jayantha Wijethilake
MARN: 0848808
Mobile: 0439 390 533
Email: jay@jayapathi.com.au

Athula Pathinayake
MARN: 0320189
Mobile: 0407 314 265
Email: athula@jayapathi.com.au

General enquiries
Telephone: 03 9888 8366
Email: enquiry@jayapathi.com.au

ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා
Dr Shahnaaz Ozeer
B.D.S. , Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ
DENTIST
Facilities are also available for :
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Preventive Care
1254 Plenty Road, Bundoora 3083
Tel : 03 9467 7760